දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ ඉල් අව දියවක ලත් බුධ දින | කාණ්ඩය 111 | පත්‍රය 299 | පිටු 36 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 දෙසැම්බර් 02 බදාදා

සාර භූමියේ හරිතාභාන්දය
අඳ පත්‍රය සමග

කොවිඩ් ව්‍යාප්තිය



දේශීය කොවිඩ් ඔසුව වැඩිදියුණුවට රාජ්‍ය අනුග්‍රහය

මහින්ද අලුත්ගෙදර

කොවිඩ්-19වෛරසයට එරෙහිව දේශීයව නිශ්පාදනය කළ ඖෂධය සම්බන්ධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අවධානය යොමුව තිබේ.

කොවිඩ් මර්දනය සම්බන්ධයෙන් වන ජනාධිපති කාර්ය සාධක බළකාය ඊයේ (01) රැස්වූ අවස්ථාවේ දී මේ පිළිබඳ ජනාධිපතිවරයාගේ අවධානය යොමුව තිබෙන අතර ඒ අනුව මේ දේශීය ඖෂධය සම්බන්ධයෙන් වන ඉදිරි පර්යේෂණ කටයුතු සිදුකරන ලෙසට ඖෂධ නිෂ්පාදන, නියාමනය හා සැපයුම් රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය මට්ටමින් සිදුකරන ලෙසට උපදෙස් දී ඇත. පිට 06

කොවිඩ් මළ සිරුරු ආදාහනයට එරෙහි

පෙත්සම් 12ක් ප්‍රතික්ෂේ

නෙල්කා මැදගෙදර

කොවිඩ් 19 වයිරසය ආසාදනය වී මරණයට පත්වන පුද්ගලයන් ගේ මළ සි... එරෙහිව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රිෂාඩ් බදියුදීන්, රවුෆ් හකීම් ... පිරිසක් විසින් ගොනු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් පෙත්සම් 12ක් විභාගයට ග... ප්‍රතික්ෂේප කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (01) තීරණය කළේය. පිට 06

පෙත්සම්කාර පාර්ශ්වයේ එම්. ඒ. සුමන්තිරන්, සාලිය පීරිස්, විරාන් කොරයා නීතිඥවරු දීර්ඝව

කිසිම ව්‍යාපෘතියකට ණය ගන්නේ නෑ

...ජය තීරණය ...ර ඇතැයි ජනමාධ්‍ය ...ඇමැති කියයි

ග්‍රෑන්ඩ් හයාට් ව්‍යාපෘතිය හදිසියේ නතර කිරීමෙන් බිලියන 31.8ක පාඩුවක්

සිතාරා සේනානි

2012 දී ආරම්භ වූ ග්‍රෑන්ඩ් හයාට් හෝටල් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2015 බලයට පැමිණි ආණ්ඩුව හදිසියේ නතර කිරීම නිසා රුපියල් බිලියන 31.8ක පාඩුවක් මහජනතාවටත්, ආණ්ඩුවටත් සිදුව තිබෙන බව බලශක්ති ඇමැති හා සම කැබිනට් ප්‍රකාශක උදය ගම්මන්පිල මහතා පවසයි. පිට 06

සා. පෙළ පැවැත්වෙන දිනය සති 6කට පෙර දන්වනවා

පිට 06

ඉහළම අධිකරණයට පත්කළ නව විනිසුරුවරු 21ක් ජනපති ඉදිරියේ දිවුරුම් දෙති

මහින්ද අලුත්ගෙදර

අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කර එහි ක්‍රියාකාරිත්වය දේශපාලන සහ වෙනත් මැදිහත්වීම්වලින් ඉවත් කරන බවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහතික වෙයි.

මෙරට අධිකරණ ක්ෂේත්‍රයේ කඩඉමක් සටහන් කරමින් ඉහළම අධිකරණයට පත්කළ නව විනිසුරුවරු 21 දෙනෙක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරියේ දිවුරුම් දුන් අතර ශ්‍රේෂ්ඨාධිකරණයට නව විනිසුරුවරු 06 දෙනෙක්, අභියාචනාධිකරණ නව සභාපති සහ අභියාචනාධිකරණ නව විනිසුරුවරු 14 දෙනෙක් ඊයේ (01) පස්වරුවේ ජනාධිපති කාර්යාලයේ දී දිවුරුම් දුන්හ. පිට 06

මහර ගැටුමෙන් 11ක් මරුට

බුද්ධිකා ඉඹුලාන, රක්ෂණ ශ්‍රියන්ත සහ රාගම සමූහ

මහර බන්ධනාගාරයේ සිදු වූ ගැටුමෙන් රැඳවුවන් 11 ක් මියගොස් ඇත. තුවාල ලබා රෝහල් ගත කළ 113 දෙනකුගෙන් 16 දෙනකුගේ තත්ත්වය බරපතළ බවද මේ වන විට රාගම ශික්ෂණ රෝහලට තව දුරටත් රෝගීන් ඇතුළු කර ගැනීමට ඉඩපහසුකම් නොමැති බවත් දැනට සිදුකළ ඇන්ටි රැපිඩ් පරීක්ෂණයෙන් රැඳවියන් 26 දෙනකු ආසාදිතයින් ලෙස හඳුනා ගෙන ඇතැයිද රාගම රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය සරත් ප්‍රේමසිරි මහතා පැවසීය. පිට 06

රාජ්‍ය බැංකු විධිමත් කරන්න නිර්දේශ ගන්න පත් කළ කමිටුවේ කාලය දීර්ඝ කෙරේ

පිට 06

කොවිඩ් වැළඳී මියගිය අයගේ මරණ සහතිකය බාර නොගැනීමෙන් අර්බුදයක්

අසේල කුරුළුවංශ

කොවිඩ් අසාදිතව පේරාදෙණිය ශික්ෂණ රෝහලේදී මියගිය හැත්තෑ තුන් හැවිරිදි මහනුවර ගලහ ප්‍රදේශයේ පුද්ගලයාගේ දේහය සෞඛ්‍ය නිර්දේශ අනුව ආදාහනය කිරීම සඳහා ඔහුගේ මරණ සහතිකය ඥාතීන් විසින් බාරගත යුතු වුවත් ඊයේ (01) දහවල් වන විටත් ඔවුන් එය භාර ගැනීමට නොපැමිණීම නිසා අර්බුදයක් මතුව තිබෙන බව පේරාදෙණිය ශික්ෂණ රෝහලේ හදිසි මරණ පරීක්ෂක අමල් ජයවර්ධන මහතා පවසයි. පිට 06

මහර බන්ධනාගාර සිද්ධිය කමිටුවෙන් ඉල්ලා අස්වෙනවා

පිට 06

තිදෙනකුට මරු කැඳවූ නුවර ගොඩනැඟිල්ලේ හිමිකරුට ඇප

පිට 06

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ කාටවත් කොවිඩ් නෑ

පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර සහ සන්ධ්‍යා කරුණාරත්න

ක්‍රිකට් ක්‍රීඩක ධනංජයගේ පියාගේ ඝාතන සැකකරු අබුඩාබි පොලිස් අත්අඩංගුවට

පිට 06

2018-2019 වර්ෂවල පොහොර විෂමාචාරවලට සම්බන්ධ 5කගේ සේවය අත්හිටුවයි

පිට 06

වාහන අංක තහඩු-රියදුරු බලපත්‍ර ශීඝ්‍රගාමී කුරියර් සේවාවෙන්

රේඩියෝ ගුරුවරයා සා/පෙළ බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රය සෙනසුරාදා